


# මගේම දයාබරිය

ආදරේ වෙළී මා දුක් විඳිනා විටදී
සිටියේ නුඹයි මා සිත ළඟ හැම දිනදී
සනසා මා සිත නුඹ ගත උණුසුම දී
කඳුලේ මා හට ගිල යන්නට නොම දී
රැක ගත්තේ නුඹ මා
**ඇයි දැයි නොදන්නෙමී...**

ගීයක තනුවක් වී මගෙ දිවි කතරේ
සුසුමත්, පැතුමත් වී මගෙ හද පතුලේ
දිවියට අරුතක් ගෙන දී සැම දින දී..
**පුබුදු කලා මා හද යළි පණ දී...**

ආදරයෙන් මා ගත සිත පණ ගැන් වූ
නුඹ මා සිත ගත් මගේම මන බැන්දූ
කෙසේ කොහොම ආවද තාමත් නොදැනූ
**ඔබ වේ මාගේ දයාබරිය සුර දූ....**

**දමිත් සුරංග දිසානායක**
එංගලන්තය

# පහන් වැට

සංස්කරණය
තුෂාරි ප්‍රියංගිකා

# කළගුණ සිහි කරමු ලක් අපි බැති සිතින

දෙදහස් වසර පන්සිය ගණනකට පෙර
ලක්වැසි සැවොම නොදියුණු ලෙස ඇත හැසිර
ඉතිහාසයෙන් පෙන්වන ඒ දිගු පාර
හරිමග හැරුණෙ ගැලු පසු සදහම් දහර

අනුබුදු මිහිඳු සම්දුන් සහ ආ පිරිස
ලක්බිම වෙතට පෑවේ කරුණා දෙඇස
දුනු හී රැගෙන දුවනා රජ තෙම තිස්ස
නැවතුනෙ තෙමී ගෙන දහමේ පොද වැස්ස

බිහි වී සසුන් කෙත ඔප කළ සඟ රුවන
රජ මැතිඳුන්ගෙ රැකවරණය ලැබ සොඳින
දෙසමින් බණ දහම් නිරතුරු සිත නමන
සසරේ බැමි ලෙහා සැනසුණි දැක නිවන

වැව් දිනු රටේ නැත හිඟයක් බත බුලතින්
රට සරු උනා දුන් උපදෙස් හා දැනුමෙන්
දාගැබ්, ආරාම, මාලිග කල ශිල්පීන්
කැටයම්, පිළිම නෙළුවා විස්මිත අයුරින්

අදහස් ලියන්නට අක්ෂර කලා පෙළක්
ජන හද පහන් කල සාහිත ගී රසයක්
අනුරාපුරයෙ සිරි මහ බෝපත් සිසිලක්
අතරින් වැඩුණෙ ගුණ ගරු පිරි සමාජයක්

රන්, මුතු, මැණික් ලොව වටිනා සම්පත් වේ
ඒ හැම පරදනා අගයක් හෙළ සතු වේ
මිනිසත් බවට කැටි වූ බුදු දම එය වේ
නමදිමු බැතින් හිමි මිහිඳුන් ගුණ සිහිවේ

**වසන්තා විජේවර්ධන**
බටහිර ඕස්ට්‍රේලියාව

# සිහි වී නංගී

මල්බර වෙසක් මස දිනයෙක උපත ලද
කෙළිබර ලෙසින් ගත කරමින් ළමා හද
හැම විට පවසමින් වදනක් ගන්න හද
ඔබ ගත කළ දිවිය කෙතරම් සොඳුරු වෙද

සතර පෝය නිවන් යන්ට සසර දුක
වෙන් කර දිවිය ගත කර මෙත් සිල් මවක
හැමවිට සතුට යුතුකම හා ගුණ ගරුක
කඳුළින් තෙමෙනවා සිහිවන විට මතක

හබයන්, වාද නැත ඇති වී අප අතර
සොහොයුරු පෙමයි කරුණාවයි සෙනෙහෙබර
වැලපෙමි සදා ගුණ ඔබගේ මතක් කර
හමු වේවා එක් දිනයෙක මතු සසර

**ආතර් පද්මපෙරුම**
**කැන්බරා**

# එහෙ සහ මෙහෙ

බස්සෙකට නගිනකල්
නගින්න, නගින්න
නැග්ගට පස්සෙ
පස්සට, පස්සට, පස්සට යන්න
මොකද ඔතන නැවතිලා
අපි ගෙදර ගෙනියන්නෙ නෑ
පස්සට, පස්සට
කෝ කෝ මාරු සල්ලි ගන්න
අපේ බස්වල යද්දි
පුරුද්දට කෑගහන මේ සද්දෙ
හොඳින් හුරු අපිට
බස්සෙකට නගිද්දි
HAI; HOW ARE YOU TODAY?
ආපසු බහිද්දි
HAVE A GREAT DAY!!
TAKE CARE

**මේනකා ජයතිලක**
ක්වින්ස්ලන්තය

# දියුණුව

ගුවනේ සිට බලන විට
කවකටු පෙට්ටියක් වැනි
කොන්ක්‍රීට් හා යකඩෙන් සැදි
විසල් නිව්යෝක් නුවර

දෙකොණ පත්තු වී දුවන
රොබෝ වරුන් මැද
මංමුලා වී
සිතමි ඔබ ගැන

මග තොටදි දුටු විට
සිනා මල් පුබුදු වන
රැඳී ලෙන්ගතු කමින්
වචනයක් හෝ දොඩන
වෙළෙන - දැවටෙන
ඇලෙන -තැවරෙන
අපේ සුන්දර මිනිස්සු
ලංකාවේදි හමු වන
කිමද කාරණ
සිඳෙන්නට මිනිස්කම
මනු සතා
දියුණුව කරා යන විට

**ශ්‍රියාණි පෙරේරා**
නිව්යෝක් නුවර




# නාඥුනන සොයුරිය!

නුඹ හඬන්නේ නුඹ පුතුගේ මරණය වෙනුවෙන්
මා හඬන්නේ මා පුතුගේ මරණය වෙනුවෙන්
කෙලෙස නම් අප තව දුරටත් නිහඬව සිටින්නද??
මෙතන සටනක් - අතන සටනක්
සැම තැනම සටන්..
තෙල් වලට ගැටෙන්නේ - මායිම් වලට ගැටෙන්නේ
ජාතියේ නාමයෙන් - ආගමේ නාමයෙන්
ඇයි අපි සටන් කරන්නේ??
මහමග, ගම් නියම් ගම් අතර,
නගර තෙමා ගෙන ගලන්නේ
ඔබෙත් මගෙත් මස්, ඇට නහර අතරින් ගලා ගිය
එකම පාට ලේ බව අපි නොදනිමුද??
නුඹ පුතු කුමන අවියක් දැරුවත්
මා පුතු කුමන අවියක් දැරුවත්
මිය යන්නේ අප දෙදෙනාගේ පුතුන් මිස
අවිය ඔවුන් අතට දුන් නායකයින් නොව.
සොයුරිය, නුඹෙ කඳුළුත් - මගේ කඳුළුත්
මහ පොළොවට එක් වුණාට
වෙන්ව ගිය අප පුතුන් කිසිදා
නොඑන බව අපි දනිමු පෙරළා
ඉදින්, කිමද අපි මේ යුද්ධයට තවත් ඉඩ දෙන්නේ????

**රම්‍යා ලක්ෂ්මී ජයසිංහ** -බර්ලින්

# යන්නු (නො)යම්

මගේ නෙත ඔබ ගන්න
පෙනෙන්නට නොව ලොව
දකින්නට පෙනෙන ලොව

විෂ දුමින් ජරා වුණ
පෙනහැල්ල වීසි කර
මල් සුවඳ විඳ ගන්න
මිතුර එය ඔබ ගන්න

සමානව බෙදන්නට
රුධිරය ද ප්‍රේමය ද
නිමල හද පිළි ගන්න
රැගෙන එය රැක ගන්න

මත් ජලයෙ තැම්බුණ
වකුගඩුව වළ දමා
මෙත් ජලයෙ කිමිදෙන්න
මෙන්න එය දෝතින්ම

අඩුපාඩුවක් ඇතොත්
තවත් ඇත ගත යුත්ත
ස්නායු, පටකයන්, අස්ථීන්
අවැසි නම් ..

නොපෙනෙයි කාටවත්
සුන්බුන් මිසක සිරුරක්
දුටිමි මම නුඹ නොදුටු
අගනාම වස්තුව

සියල්ලම දුන්නෙ දන්
ආයෙත් නොඑන්නට
ඒත් දැන් කෙලෙස යමි
දමා මෙහි මගේ සිත..

**ප්‍රියංකා ගුණසේකර**




# ලොවට පිපි මල

සඳුට පිපි කුමුද ද
හිරුට පිපි නෙළුම ද
නොහඳුනමි ඔබ

නටුව බිඳ දෝතට වඩා මා
හද කලස සරසනු නොරිසියෙනි

බමර තුඩු විස ගැටෙනු නොම දී
සුවඳ විඳ විඳ අසල ගැවසෙමි.

**පද්මසිරි හේරත්** ■

## මා ළඟ ඇත කවියක් ආදරයක වටිනාකම නිම්හිම් නැති...

මහගම සේකර.
-ප්‍රබුද්ධ-

කියවන්න... ලියන්න...
තොරතුරු දැන ගන්න..
www.ketapathpawra.com
වෙබ් අඩවියට ගොඩ වෙන්න..
සයිබර් අහසට ඔබේ නිර්මාණත්
ඉදිරිපත් කරන්නට
කැටපත් පවුරෙන් ඉඩක්.